(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 168. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026 ජූලි 24 සිකුරාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ බලශක්ති අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු රොෂාන් අක්මීමන මහතා**

**ගරු අජිත් අගලකඩ මහතා**

**ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

**ගරු අබූබකර් අතම්බාවා මහතා**

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

**ගරු ජේ.සී. අලවතුවල මහතා**

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද්‍ර ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු කුමාර ජයකොඩි මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු තාහිර් මරික්කාර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2026 අංක 03 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර, එම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2024 වර්ෂය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2025 වර්ෂය සඳහා ජනාධිපති අරමුදලේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2025 වර්ෂය සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යවරයා විසින් —

(i) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) කළුතර, නාගොඩ, ඩිපෝව ඉදිරිපිට, අංක 205 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඒ.පී.එම්.ඩබ්ලිව්. සේනානායක මහතාගෙන් ලැබුණු 2026.05.20 දිනැති පෙත්සම ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අළුබෝමුල්ල, රුග්ගහ පාර, අංක 118 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ. කමනි පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2025.08.05 දිනැති පෙත්සම ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(3) (i) කැප්පෙටිවලාන, ගල්දෙණිය යන ලිපිනයෙහි පදිංචි ඒ.ඒ. සිරිමල් දයාරත්න මහතාගෙන් ලැබුණු 2025.09.08 දිනැති පෙත්සම;

(ii) පොල්පිතිගම, කිරිබමුණේගම යන ලිපිනයෙහි පදිංචි ජේ.එච්. කරුණාතිලක මහතාගෙන් ලැබුණු 2026.01.19 දිනැති පෙත්සම; සහ

(iii) අලව්ව, කොහොළාන, මැදිකැලේ වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.එච්.සී.එස්.ජේ. අමරනාගල්ලගේ මහතාගෙන් ලැබුණු 2025.08.18 දිනැති පෙත්සම

ගරු අශෝක ගුණසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 397 දරන ස්ථානයෙහි පදිංචි එස්.ජී.කේ.ඩී. චමින්ද මහතාගෙන් ලැබුණු 2025.09.05 දිනැති පෙත්සම ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු ඩී.වී. චානක මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**6. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංගත්වය:** ගරු අජිත් පී. පෙරේරා මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— 2026 ජූලි මස 05 සහ 06 යන දිනවල මීගමුව බන්ධනාගාරය තුළ රැඳවියන් කණ්ඩායම් අතර ඇති වූ ගැටුම් හේතුවෙන් බන්ධනාගාර නිලධාරින් සහ රැඳවියන් ඇතුළු පුද්ගලයන් 31 ක් මිය ගොස් ඇති අතර, 100කට වැඩි පිරිසක් තුවාල ලබා ඇති හෙයින්ද;

මෙය රටේ මෑත ඉතිහාසයේ බන්ධනාගාරයක් තුළ සිදු වූ බරපතලම ගැටුමක් වන අතර, එමඟින් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ පවතින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය සහ ආරක්ෂක කළමනාකරණය පිළිබඳව බරපතල ගැටලු මතු වී ඇති හෙයින්ද;

මීගමුව බන්ධනාගාරයේ අවි ආයුධ හා ආරක්ෂිත උපකරණ සුරක්ෂිතව පවත්වා ගැනීමට අපොහොසත් වීම සහ රැඳවියන් අතර ගැටුම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග නොගැනීම යනාදිය බන්ධනාගාර පරිපාලනයේ දරුණු අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන හෙයින්ද;

2026 ජූලි මස 05 ගැටුම ආරම්භ වූ දින එය නිරාකරණය කිරීම සඳහා කඩිනමින් ප්‍රමාණවත් සහ කාලෝචිත පියවර ගැනීමට අධිකරණ විෂය භාර අමාත්‍යවරයා අපොහොසත් වීම තුළ ජූලි මස 06 වන දින ගැටුම් තීව්‍ර වූ බැවින්ද;

පූර්ව සැලසුමකින් තොරව රාජ්‍ය නිලධාරීන් වන බන්ධනාගාර නිලධාරීන් ගැටුම සිදු වූ ස්ථානයට යොමු කිරීම තුළින් එම නිලධාරීන්ගේ ජීවිත අනතුරකට දැමූ හෙයින්ද;

රාජ්‍ය බන්ධනාගාර පද්ධතිය තුළ රැඳවියන්ගේ හා නිලධාරීන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ අවසාන වගකීම දරන අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීමට අසමත් වී ඇති බව මෙම ගරු සභාව විශ්වාස කරන හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පවරා ඇති බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය සහ බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය හා තදබදය අඩු කිරීම යන කාර්යයන් වගකීම් සහිතව ඉටු කර නොමැති හෙයින්ද;

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ බන්ධනාගාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා අපොහොසත් වීම තුළ ජනතාව විසින් ලබාදුන් ජනවරමට විරුද්ධ වී ඇති හෙයින්ද; සහ

ඉහත සඳහන් කළ කරුණු අනුව, අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති කාර්යයන් වගකීමෙන් ඉටුකර නොමැති බැවින් සහ පැවරී ඇති කාර්යයන් පිළිබඳව අමාත්‍යවරයා වගවීමක් රහිතව කටයුතු කරන බව බැලූ බැල්මටම පෙනී යන හෙයින්;

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට තවදුරටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ධුරයේ කටයුතු නිසි පරිදි ඉටු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(පූ.භා. 11.34 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.50 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි පරිසර අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.19 ට ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.43 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 36; විරුද්ධව 152; යනුවෙන් බෙදී, එය නිශ්ප්‍රභ විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය අසූතුන්දෙනෙක් (183) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | No |
| G 002. Sunil Handunnetti | No |
| G 005. Nalinda Jayatissa | No |
| G 006. Bimal Rathnayake | No |
| G 007. Harini Amarasuriya | No |
| G 009. Ramalingam Chandrasekar | No |
| G 010. Wasantha Samarasinghe | No |
| G 011. A.H.M.H. Abayarathna | No |
| G 012. Chrishantha Abeysena | No |
| G 013. Anil Jayantha | No |
| G 014. Harshana Nanayakkara | No |
| G 015. Dammika Patabendi | No |
| G 016. Saroja Savithri Paulraj | No |
| G 017. Ananda Wijepala | No |
| G 018. Hiniduma Sunil Senevi | No |
| G 019. Sunil Kumara Gamage | No |
| G 020. Susil Ranasinghe | No |
| G 021. Rizvie Salih | No |
| G 022. Anura Karunathilaka | No |
| G 023. Upali Pannilage | No |

| | |
|---|---|
| G 024. Kumara Jayakody | No |
| G 025. Nihal Galappaththi | No |
| G 026. Nihal Abeysinghe | No |
| G 027. Namal Karunaratne | No |
| G 028. Wasantha Piyathissa | No |
| G 029. Gamagedara Dissanayake | No |
| G 030. R.M. Jayawardhana | No |
| G 031. Sunil Watagala | No |
| G 032. Rathna Gamage | No |
| G 033. Mahinda Jayasinghe | No |
| G 034. Chathuranga Abeysinghe | No |
| G 035. Eranga Gunasekara | No |
| G 036. Upali Samarasingha | No |
| G 037. T.B. Sarath | No |
| G 038. Nalin Hewage | No |
| G 039. Prasanna Gunasena | No |
| G 041. Hemali Weerasekara | No |
| G 042. Sundaralingam Pradeep | No |
| G 043. Ruwan Ranasinghe | No |
| G 044. Muneer Mulaffer | No |
| G 045. Hansaka Wijemuni | No |
| G 046. Eranga Weeraratne | No |
| G 047. Namal Sudarshana | No |
| G 048. P. Ruwan Senarath | No |
| G 049. Madhura Senevirathna | No |
| G 050. Arun Hemachandra | No |
| G 051. Janitha Ruwan Kodithuwakku | No |
| G 052. Aruna Jayasekera | No |
| G 053. Sugath Thilakaratne | No |
| G 054. Kaushalya Ariyarathne | No |
| G 055. Arkam Ilyas | No |
| G 056. Aravinda Senarath | No |
| G 057. Dinindu Saman | No |

| | |
|---|---|
| G 058. Nishantha Jayaweera | No |
| G 060. Lakshman Nipuna Arachchi | No |
| G 061. Gayan Janaka | No |
| G 062. Najith Indika | No |
| G 063. Lakmali Hemachandra | No |
| G 064. Samanmali Gunasingha | No |
| G 065. R.M. Gamini Rathnayake | No |
| G 066. Manjula Suraweera Arachchi | No |
| G 067. K. Ilankumaran | No |
| G 068. Shantha Pathma Kumara Subasingha | No |
| G 069. Ajith Agalakada | No |
| G 070. Sagarika Athauda | No |
| G 071. Roshan Akmeemana | No |
| G 072. U. P. Abeywickrama | No |
| G 073. L.M. Abeywickrama | No |
| G 074. M.K.M. Aslam | No |
| G 075. Asitha Niroshana Egoda Vithana | No |
| G 076. Oshani Umanga | No |
| G 077. Krishnan Kalaichelvi | No |
| G 078. Upul Kithsiri | No |
| G 079. Wasantha Pushpa Kumara | No |
| G 080. Chaminda Lalith Kumara | No |
| G 081. Sarath Kumara | No |
| G 082. Nilanthi Kottahachchi | No |
| G 083. M.A.C.S. Chathuri Gangani | No |
| G 084. Darmapriya Wijesinghe | No |
| G 085. Thilanka U. Gamage | No |
| G 086. Nilusha Lakmali Gamage | No |
| G 087. Ajantha Gammeddage | No |
| G 088. Ajith Gihan | No |
| G 089. Jagath Gunawardana | No |
| G 090. Aboobucker Athambawa | No |
| G 091. Ruwanthilaka Jayakody | No |

| | |
|---|---|
| G 092. Thushari Jayasingha | No |
| G 093. T.K. Jayasundara | No |
| G 094. Mayilvaganam Jegatheeswaran | No |
| G 095. Rajeevan Jeyachandramoorthy | No |
| G 096. Sellaththamby Thilaganathan | No |
| G 097. Sugath Wasantha de Silva | No |
| G 098. Anushka Thilakarathne | No |
| G 099. Chandana Thennakoon | No |
| G 100. Thanura Dissanayake | No |
| G 101. Dharmapriya Dissanayake | No |
| G 102. Sujeewa Dissanayake | No |
| G 103. Kanthasamy Prabu | No |
| G 104. Susantha Kumara Nawarathna | No |
| G 105. Sena Nanayakkara | No |
| G 106. Aruna Panagoda | No |
| G 107. Nimal Palihena | No |
| G 108. Nishantha Perera | No |
| G 109. Stepni Fernando | No |
| G 110. Susantha Dodawatta | No |
| G 111. Lal Premanath | No |
| G 112. Nanda Bandara | No |
| G 113. Padmasiri Bandara | No |
| G 114. Ravindra Bandara | No |
| G 115. Sudath Balagalla | No |
| G 116. Sri Bavanandarajah | No |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. R.M.Ranjith Madduma Bandara | Yes |
| O 007. Gayantha Karunathilleka | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 011. Namal Rajapaksha | Yes |
| O 014. G.G. Ponnambalam | Yes |
| O 016. Ramanathan Archchuna | Yes |
| O 017. M.A.M. Thahir | Yes |

| | |
|---|---|
| O 021. Dayasiri Jayasekara | Yes |
| O 023. Ajith P. Perera | Yes |
| O 024. Sujeewa Senasinghe | Yes |
| O 027. J. C. Alawathuwala | Yes |
| O 028. Nalin Bandara Jayamaha | Yes |
| O 029. Hector Appuhamy | Yes |
| O 030. Hesha Withanage | Yes |
| O 031. Kavinda Heshan Jayawardhana | Yes |
| O 032. Sujith Sanjaya Perera | Yes |
| O 033. S.M. Marikkar | Yes |
| O 034. Imran Maharoof | Yes |
| O 035. Harshana Rajakaruna | Yes |
| O 036. Rohini Kumari Wijerathna | Yes |
| O 041. Chaminda Wijesiri | Yes |
| O 042. Mujibur Rahman | Yes |
| O 043. Waruna Liyanage | Yes |
| O 046. W.H.M. Dharmasena | Yes |
| O 048. B. Ariyawansha | Yes |
| O 050. Chathura Galappaththi | Yes |
| O 051. Chithral Fernando | Yes |
| O 052. Amila Prasad | Yes |
| O 055. D.V. Chanaka | Yes |
| O 062. Jagath Vithana | Yes |
| O 063. Nizam Kariapper | Yes |
| O 065. E. M. Basnayaka | No |
| O 066. Wijesiri Basnayake | No |
| O 067. S. Sandaruwan Madarasinghe | No |
| O 068. Prageeth Madhuranga | No |
| O 069. Jagath Manuwarna | No |
| O 070. Ruwan Mapalagama | No |
| O 071. Nandana Millagala | No |
| O 072. Riyas Farook | No |
| O 081. Danushka Ranganath | No |

| | |
|---|---|
| O 082. Sanjeewa Ranasingha | No |
| O 083. Sunil Rathnasiri | No |
| O 084. Manjula Sugath Rathnayaka | No |
| O 085. A.M.M.M. Rathwaththe | No |
| O 086. Manoj Rajapaksha | No |
| O 087. Sunil Rajapaksha | No |
| O 088. Hasara Liyanage | No |
| O 089. Deepthi Wasalage | No |
| O 090. Kanchana Welipitiya | No |
| O 091. R. G. Wijerathna | No |
| O 092. Nishantha Samaraweera | No |
| O 093. Priyantha Wijerathna | No |
| O 094. Ruwan Wijeweera | No |
| O 095. Lasith Bhashana Gamage | No |
| O 096. Hiruni Wijesinghe | No |
| O 097. Athula Welandagoda | No |
| O 099. Thilina Samarakoon | No |
| O 100. Ambika Samivel | No |
| O 101. Dewananda Suraweera | No |
| O 103. G.D. Sooriyabandara | No |
| O 104. Kitnan Selvaraj | No |
| O 106. Chandima Hettiaratchi | No |
| O 107. Champika Hettiarachchi | No |
| O 108. Dinesh Hemantha | No |
| O 109. Geetha Herath | No |
| O 110. Bhagya Sri Herath | No |
| O 111. Muhammad Faizal | No |
| O 112. Ashoka Gunasena | No |
| O 113. Nandana Pathmakumara | No |
| O 114. Sunil Biyanwila | No |
| O 115. Samantha Ranasingha | No |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස්දෙනෙකුගේ (05) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Dilip Wedaarachchi | Yes |
| Thahir Marrikkar | Yes |
| M.S. Abthul Wazeeth | Yes |
| M.S. Uthumalebbe | Yes |
| Chandana Sooriyaarachchi | No |

**7. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුයෙන්, අ.භා. 6.16 ට කථානායකවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2026 අගෝස්තු 04 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.